# රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
# அரசகரும மொழிகள் திணைக்களம்

## II වන මට්ටම - සිංහල
## மட்டம் II – சிங்களம்

## ආදර්ශ ප්‍රශ්න
## மாதிரி வினாக்கள்
## 1 කොටස
## பகுதி 1

---

විශේෂ සටහන

I වන මටටම **සිංහල භාෂාවට** අදාළ විෂය නිර්දේශය හා පෙළ පොත් ඇසුරින් සකසන ලද ආදර්ශ ප්‍රශ්න කිහිපයක් විභාග අපේක්ෂකයන් වන ඔබගේ පහසුව පිණිස ඉදිරිපත් කර ඇත.

விசேட குறிப்பு

I ஆம் மட்டம் சிங்கள மொழிக்கான பாடப்பரப்பிற்கும் பாடப்புத்தகத்திற்கும் அமைவாக தயாரிக்கப்பட்ட மாதிரி வினாக்கள் சிலவற்றை பரீட்சார்த்திகளின் வசதிக்காக முன்வைக்கப்பட்டுள்ளது.

01. වරහන් තුළ දී ඇති අකුරුවලින් එක් අකුරක් යොදා ගෙන වචන දෙකෙහිම අර්ථය එන සේ සකසන්න.

1. ව …….       ( ම , අ, ර )

   …... ම

2. …….ගත       (මා ,සා , ආ )

   …….යම

3. ග …. න       (ණ ,න ,හ )

   න…..න

02. පහත දී ඇති අකුරු ගලපා නිවැරදි අර්ථය එන වචන සකස් කරන්න.

1. සපාල - ………………………….…
2. වරුඹ - ……………………………

03. වරහන් තුළ දී ඇති වචන දෙක නිවැරදිව යොදා අර්ථවත් වාක්‍ය සකසන්න.

1. පුර .................. අහසේ පායා ඇත. (හද, හඳ )
   භය වූ විට .............ගැස්ම වේගවත් වේ.

2. ගොවිපලක ඇති කුඩා නිවස ..................යි. (පැළ , පැල)
   ලොකු ගහක් කුඩා කාලයේදී ................යයි.

04. පහත දී ඇති පදවල සමානාර්ථ පදය ලියන්න.

1. උත්සවය - ....................................
2. රෝගය -.....................................
3. කූට - ....................................

05. පහත දී ඇති පදවල විරුද්ධාර්ථ පද ලියන්න.

1. ප්‍රමාදය - ....................................
2. දුර්වල - ...................................
3. නීතිය - ...................................

06. පහත දැක්වෙන එක් එක් වාක්‍යයේ හිස්තැනට ගැලපෙන වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

1. අද උදෑසන මම කාර්යාලයට එන විට පැයක් ප්‍රමාද ........................... (විය / වුණෙමි )
2. නැටුම් තරඟයට ඉදිරිපත්වීමට නංගී නැටුමක් පුහුණු .......................... (වන්නීය / වෙයි)

3. මිනිස්සු ආර්ථික දුෂ්කරතාවලින් පීඩාවට පත් වී ................................ (සිටියි / සිටිති)

07. පහත දී ඇති වාක්‍යවල කථන ව්‍යවහාරයෙන් ඇති ඉරි ඇඳි පද ලේඛන ව්‍යවහාරයට හරවා වාක්‍ය සම්පූර්ණ කරන්න

1. **හුඟක්** **මහන්සි වූ** දරුවෝ **කෑන්ටීමට** ගොස් කෑම **කෑවා.**
2. **එයාලට** සිදු වූ අසාධාරණය ගැන සියලු දෙනාම **දුක් වුණා**.

08. වරහන් තුළින් සුදුසු වචනය තෝරා ඡේදය සම්පූර්ණ කරන්න.

(කණ්ඩායමේ , ජයග්‍රහණය , මණ්ඩලයේ , නිර්දේශයක් , පුහුණුකරුවන් , සාර්ථක , නායකයෙක් , තනතුරේ , වගකීමක්, ශ්‍රී ලාංකිකයන් , තාවකාලික , ටෙස්ට්, ත්‍රිත්වයේ , )

මාවන් අතපත්තු ශ්‍රී ලංකා ක්‍රිකට් (1) ....................................... ප්‍රධාන පුහුණුකරු තනතුරට පත්විය. මාවන් එම තනතුරට පත්වන්නේ ඒ වෙනුවෙන් ම පත් කළ විශේෂ කමිටු (2)............................ මතය. මෙම තනතුර සඳහා දෙස් විදෙස් (3)........................................ 19 දෙනෙක් ඉල්ලුම් කළ අතර ඉන් 9 දෙනෙක් කෙරෙහි ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක (4).............................................අවධානය වඩාත් යොමුව තිබුණි. එහෙත් වඩාත් ම තියුණු තරගය තිබී ඇත්තේ මාවන් හා තවත් විශේෂ වූ විදෙස් පුහුණුකරුවෙක් කෙරෙහි ය යන්න පසුව කතාබහට ලක්වී තිබේ. එහෙත් (5) .................................... හිමි වූයේ මාවන්ට යි. "ක්‍රිකට් ක්‍රීඩාවෙන් ක්‍රීඩකයෙක් ලෙසත් (6)..................................... ලෙසත් රට වෙනුවෙන් සේවය කරන්න මට අවස්ථාව ලැබුණා. ඒක වාසනාවක් ලෙස යි මම දකින්නෙ. දැන් මේ තනතුරත් සමඟ මට වඩා වැඩි (7) ........................................... ලැබී තිබෙනවා. වසර ගණනාවක් ශ්‍රී ලංකා කණ්ඩායම සමඟ කටයුතු කළ මට මේ

(8) ....................................... නායකයෙක් ලෙස කටයුතු කිරීම ඉතා ම පහසුවක් ලෙස යි හැඟෙන්නෙ. හැම දෙයක් ම (9) ................................ වෙයි. සියල්ල තීරණය කරන්නේ එළැඹෙන ලෝක කුසලාන තරගාවලිය ඉලක්ක කරගනිමින්" මාවන් මාධ්‍ය වෙත පවසා සිටියා. මාවන් මේ තනතුරේ කටයුතු කිරීමට ප්‍රථම පසුගිය කාලයේ (10) .................................... පුහුණුකරු ලෙස ද කටයුතු කළා. ඒ අතුරින් වඩාත් ම කතා බහට ලක් වූයේ පසුගිය ජුනි මාසයේ එංගලන්තයේදී (11) .............................. තරගාවලිය, එක්දින තරගාවලිය සහ විස්සයි/ 20 තරගාවලිය යන තරගාවලි (12) .............................. දී ම කණ්ඩායම ජයග්‍රහණය කරා ගෙන යෑමට මාවන්ගෙන් ලැබුණ උපදෙස් පිළිබඳවයි. එමෙන් ම දකුණු අප්‍රිකාවට එරෙහිවත් මෙරටදී සාර්ථක ව තරගමාලා නිමා කිරීමට පුහුණු උපදෙස් දුන් පුහුණුකරුවා ද ලෙස යි. මාවන්ට ප්‍රථම ශ්‍රී ලංකා කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු තනතුර(13) .................................. අතුරින් 1999 වසරේදී රෝයි ඩයස් දරා ඇති අතර ඊට අමතර ව තාවකාලික පුහුණුකරු තනතුරේ දුලිප් මෙන්ඩිස් හා රොමේෂ් රත්නායක යන අය ද කටයුතු කර තිබෙනවා.

8. ඡේදයක් කියවා ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම.

# රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

## I වන මට්ටම - සිංහල

## 1 කොටස

### පිළිතුරු

---

01. වරහන් තුළ දී ඇති අකුරුවලින් එක් අකුරක් යොදා ගෙන වචන දෙකෙහිම අර්ථය එන සේ සකසන්න.

1. ව …ම.. ( ම , අ, ර )

   ම... ම

2. ...සා....ගත (මා ,සා , ආ )

   ..සා.....යම

3. ග ..හ.. න (ඝ ,න ,හ )

   න..හ...න

02. පහත දී ඇති අකුරු ගලපා නිවැරදි අර්ථය එන වචන සකස් කරන්න.

1. සපාල - .........පාසල.........................
2. වරුඔ - ..........ඔරුව.........................

03. වරහන් තුළ දී ඇති වචන දෙක නිවැරදිව යොදා අර්ථවත් වාක්‍ය සකසන්න.

1. පුර ........හඳ........... අහසේ පායා ඇත. (හද, හඳ )

   භය වූ විට .....හද.........ගැස්ම වේගවත් වේ.

2. ගොවිපලක ඇති කුඩා නිවස ......පැල............යි. (පැළ , පැල)

   ලොකු ගහක් කුඩා කාලයේදී .....පැළ............යයි.

04. පහත දී ඇති පදවල සමානාර්ථ පදය ලියන්න.

1. උත්සවය - ........උළෙල.........................
2. රෝගය -.........අසනීපය.......................
3. කූට - .........කපටි...........................

05. පහත දී ඇති පදවල විරුද්ධාර්ථ පද ලියන්න.

1. ප්‍රමාදය - ......අප්‍රමාදය..............................
2. දුර්වල - ......ශක්තිමත්.............................
3. නීතිය - ........අවනීතිය...........................

06. පහත දැක්වෙන එක් එක් වාක්‍යයේ හිස්තැනට ගැලපෙන වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

1. අද උදෑසන මම කාර්යාලයට එන විට පැයක් ප්‍රමාද ...වුණෙමි...........
   (විය / වුණෙමි )
2. නැටුම් තරඟයට ඉදිරිපත්වීමට නංගී නැටුමක් පුහුණු .........වන්නීය.......
   (වන්නීය / වෙයි)
3. මිනිස්සු ආර්ථික දුෂ්කරතාවලින් පීඩාවට පත් වී .........සිටිති........
   (සිටියි / සිටිති)

07. පහත දී ඇති වාක්‍යවල කථන ව්‍යවහාරයෙන් ඇති ඉරි ඇදි පද ලේඛන ව්‍යවහාරයට හරවා වාක්‍ය සම්පූර්ණ කරන්න

1. <u>හුඟක්</u> <u>මහන්සි වූ</u> දරුවෝ <u>කැන්ටිමට</u> ගොස් කෑම <u>කෑවා.</u>
   <u>අධික වෙහෙසට පත්</u> දරුවෝ <u>ආපන ශාලාවට</u> ගොස් ආහාර අනුභව කළෝය.

2. <u>එයාලට</u> සිදු වූ අසාධාරණය ගැන සියලු දෙනාම <u>දුක් වුණා</u>.

<u>ඔවුන්ට</u> සිදු වූ අසාධාරණය ගැන සියලු දෙනාම <u>දුක් වූහ</u>

08. වරහන් තුළින් සුදුසු වචනය තෝරා ඡේදය සම්පූර්ණ කරන්න.

(කණ්ඩායමේ , ජයග්‍රහණය , මණ්ඩලයේ , නිර්දේශයක් , පුහුණුකරුවන් , සාර්ථක , නායකයෙක් , තනතුරේ , වගකීමක්, ශ්‍රී ලාංකිකයන් , තාවකාලික , ටෙස්ට්, ත්‍රිත්වයේ , )

මාවන් අතපත්තු ශ්‍රී ලංකා ක්‍රිකට් (1) ......කණ්ඩායමේ................................. ප්‍රධාන පුහුණුකරු තනතුරට පත්විය. මාවන් එම තනතුරට පත්වන්නේ ඒ වෙනුවෙන් ම පත් කළ විශේෂ කමිටු (2)..... නිර්දේශයක්....................... මතය. මෙම තනතුර සඳහා දෙස් විදෙස් (3)........... පුහුණුකරුවන්............................ 19 දෙනෙක් ඉල්ලුම් කළ අතර ඉන් 9 දෙනෙක් කෙරෙහි ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක(4)...........මණ්ඩලයේ...........................අවධානය වඩාත් යොමුව තිබුණි. එහෙත් වඩාත් ම තියුණු තරගය තිබී ඇත්තේ මාවන් හා තවත් විශේෂ වූ විදෙස් පුහුණුකරුවෙක් කෙරෙහි ය යන්න පසුව කතාබහට ලක්වී තිබේ. එහෙත් (5) ..........ජයග්‍රහණය..... හිමි වූයේ මාවන්ට යි.

"ක්‍රිකට් ක්‍රීඩාවෙන් ක්‍රීඩකයෙක් ලෙසත් (6)........... නායකයෙක්.......................... ලෙසත් රට වෙනුවෙන් සේවය කරන්න මට අවස්ථාව ලැබුණා. ඒක වාසනාවක් ලෙස යි මම දකින්නෙ. දැන් මේ තනතුරත් සමඟ මට වඩා වැඩි (7) .......... වගකීමක්.............................. ලැබී තිබෙනවා. වසර ගණනාවක් ශ්‍රී ලංකා කණ්ඩායම සමඟ කටයුතු කළ මට මේ (8) .................... තනතුරේ................. නායකයෙක් ලෙස කටයුතු කිරීම ඉතා ම පහසුවක් ලෙස යි හැඟෙන්නෙ. හැම දෙයක් ම (9) ............... සාර්ථක............... වෙයි. සියල්ල තීරණය කරන්නේ එළැඹෙන ලෝක කුසලාන තරගාවලිය ඉලක්ක කරගනිමින්" මාවන් මාධ්‍ය වෙත පවසා සිටියා.

මාවන් මේ තනතුරේ කටයුතු කිරීමට ප්‍රථම පසුගිය කාලයේ (10) ........ තාවකාලික............. පුහුණුකරු ලෙස ද කටයුතු කළා. ඒ අතුරින් වඩාත් ම කතා බහට ලක් වූයේ පසුගිය ජුනි මාසයේ එංගලන්තයේදී (11) ............ ටෙස්ට්........ තරගාවලිය, එක්දින තරගාවලිය සහ විස්සයි/ 20 තරගාවලිය යන තරගාවලි (12) .......... ත්‍රිත්වයේ...... දී ම කණ්ඩායම ජයග්‍රහණය කරා ගෙන යෑමට මාවන්ගෙන් ලැබුණ උපදෙස් පිළිබඳවයි. එමෙන් ම දකුණු අප්‍රිකාවට එරෙහිවත් මෙරටදී සාර්ථක ව තරගමාලා නිමා කිරීමට පුහුණු උපදෙස් දුන් පුහුණුකරුවා ද ලෙස යි. මාවන්ට ප්‍රථම ශ්‍රී ලංකා කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු තනතුර(13) ......... ශ්‍රී ලාංකිකයන්..... අතුරින් 1999 වසරේදී රෝයි ඩයස් දරා ඇති අතර ඊට අමතර ව තාවකාලික පුහුණුකරු තනතුරේ දුලිප් මෙන්ඩිස් හා රොමේෂ් රත්නායක යන අය ද කටයුතු කර තිබෙනවා.

8. ඡේදයක් කියවා ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

# I වන මට්ටම - සිංහල

# மட்டம் I – சிங்களம்

## ආදර්ශ ප්‍රශ්න

## மாதிரி வினாக்கள்

## 2 කොටස

## பகுதி 2

1. දී ඇති මාතෘකාවක් යටතේ වචන 200ක් පමණ වන සේ රචනයක් ලිවීම.

   උදා: මාර්ග අනතුරු වලක්වා ගැනීම

2. දී ඇති ඡේදයක් සාරාංශ කොට ලියා ඊට සුදුසු මාතෘකාවක් ද යෙදීම
3. දී ඇති ඡේදයක් දෙමළ බසට පරිවර්තනය කිරීම.
4. දී ඇති ඡේදයක් සිංහල බසට පරිවර්තනය කිරීම.
5. දී ඇති කරුණකට වාර්තාවක් පිළියෙල කිරීම.
6. දී ඇති කරුණකට වාර්තාවක් පිළියෙල කිරීම.

මේ ආකාරයේ ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයක් ඔබ වෙත ඉදිරිපත් වීමට ඉඩ ඇත.

ඔබගේ පුහුණුවට හා මඟ පෙන්වීමට සහයක් ලෙස මෙම කරුණු ඉදිරිපත් කර ඇත.